1556

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - 2023
**STP8305/STP8505/ ESP2202-** තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටළු
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.11.18 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද II වන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. ගුරුවරුනට සහ ප්‍රතිපත්ති සම්පාදකයන්හට තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමෙන් ලැබෙන වාසි දෙකක් (02) දක්වන්න.

02. ශ්‍රී ලංකාවේ පැවැති පෘතුගීසි හා ලන්දේසි අධ්‍යාපන පද්ධති දෙක (02) අගයන්න.

03. 1932 ග්‍රාමීය අධ්‍යාපන යෝජනා ක්‍රමයේ ඇති වැදගත්කම අගය කරන්න.

04. 1867 මෝර්ගන් කමිටු යෝජනා පහක් (05) ලියන්න.

05. 1944 බට්ලර් පනතේ ප්‍රධාන යෝජනා අතරින් ධනාත්මක යෝජනා දෙකක් (02) කෙටියෙන් අගය කරන්න.

06. 1981 ධවල පත්‍රිකාවෙහි අඩංගු වූ ප්‍රධාන ප්‍රතිසංස්කරණ යෝජනා හතරක් (04) දක්වන්න.

07. සංවර්ධිත රටවල අධ්‍යාපනයේ නව ප්‍රවනතා තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනයෙහි ගෝලීයකරණය නිසා ඇති වූ ධනාත්මක බලපෑම් පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ පැරණි අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 04)

(ii) පැරණි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයෙහි යොදාගත් විෂය මාලාවේ ස්වභාවය, ඉගැන්වීම් ක්‍රම සහ ඉගෙනුම් සම්පත් මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවෙහි පැරණි අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රබලතා හා දුබලතා අගයන්න. (ලකුණු 08)

10. (i) 1943 අධ්‍යාපන කමිටුවක් පත් කිරීමට හේතු වූ කරුණු විස්තර කරන්න. (ලකුණු 04)

(ii) 1943 විශේෂ අධ්‍යාපන කමිටු යෝජනා පහක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) පසුකාලීන ශ්‍රී ලංකා සමාජයට එයින් ඇති වූ බලපෑම අගය කරන්න. (ලකුණු 10)

11. (i) සම අධ්‍යාපන අවස්ථා සම්පාදනයේ දී දියුණු වෙමින් පවතින රටවල්වලට මුහුණ පාන්නට සිදු වී ඇති ගැටලු තුනක් **(03)** දක්වන්න. (ලකුණු 04)

(ii) නිදහස ලබාගත් දවසේ සිට අද දක්වා ශ්‍රී ලංකා රජය විසින් අධ්‍යාපනය සඳහා සමඅවස්ථා ලබාදීම සඳහා ගත් පියවර අගය කරන්න. (ලකුණු 06)

(iii) වර්තමානයේ දී අධ්‍යාපන සම අවස්ථා ලබාදීමේ දී ශ්‍රී ලංකාවට ඇති බාධක පරීක්ෂා කර එම බාධක මඟහරවා ගැනීමට ඔබගේ යෝජනා හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) 'බහුවාර්ගික සමාජය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) බහුවාර්ගික රටවල අධ්‍යාපනයෙහි ඇති ගැටලු විසදීම සඳහා අනුගමනය කර තිබෙන ප්‍රතිපත්ති මොනවා ද? රටවල් දෙකක් (02) ඇසුරින් උදාහරණ දෙකක් **(02)** ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

13. (i) 'වැඩලෝකය' යන සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් කළ වැඩලෝකය හා සම්බන්ධ වූ යෝජනා අගය කරන්න. (ලකුණු 08)

(iii) එම යෝජනා අසාර්ථක වීමට බලපෑ සාධක විස්තර කරන්න. (ලකුණු 08)

14. (i) ශ්‍රී ලංකාව තුල මේ වන විටත් තරුණ විරැකියාව පවතින බවට ඔබ එකඟ වනවා ද? ඔබේ පිළිතුරුට හේතු තුනක් **(03)** දක්වන්න. (ලකුණු 04)

(ii) ද්විතියික අධ්‍යාපන මට්ටම සමග තාක්ෂණය සම්බන්ධ කිරීමෙන් ලැබෙන වාසි හතරක් **(04)** පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) වර්තමාන ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා තාක්ෂණය සමඟ අධ්‍යාපනය සම්බන්ධ කළ හැකි ආකාරය පිළිබඳ ඔබගේ විසඳුම් හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.